# Abstract No 76

## රශ්මි විහිදන අසිරිමත් සිරුර

**එච්.බී. යසරත්න**
මානව ශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය.

යෝග දර්ශනයේ දැක්වෙන චින්තන ශක්තිය, ශරීර රශ්මිය, දිව්‍යැස පරචිත්ත විජානය, හා චිත්ත බලයෙන් රෝග සුව කිරීම පිළිබඳ විමසුමක්. මිනිසා සැදී ඇත්තේ කෙසේ ද? ඔහුගේ අභ්‍යන්තර ක්‍රියාකාරීත්වය කෙසේ සිදු වේ ද? මිනිස් සිරුරෙහි ගුප්ත ශක්තිය නිරාවරණය කරනුයේ කෙසේ ද? යන්න පිළිබඳ ව යෝග ශාස්ත්‍රයෙන් මූලික වශයෙන් ඉගැන්වේ. පංතජලී ඍෂිවරයාගේ යෝග සූත්‍රයෙහි එන අභ්‍යාසයන්හි අනලස් ව යෙදෙන යෝගියා හට මිනිස් සිරුර තුළ පවත්නා විදුලි බලයට සමාන ශක්තිය ක්‍රමානුකූල ලෙස වර්ධනය කරගත හැකි ය. මෙලෙස මිනිස් සිරුරේ කොටස් නිසි පරිදි සුසර කොට ශරීරය තුළ ඇති විද්‍යුත් ශක්තිය වර්ධනය කිරීම දිවසත් ලැබීම හෝ දිවැස් ලැබීම ලෙස හැඳින්වෙන අතර, බුදුවරුන්, රහතන් වහන්සේ, උසස් බලයක් ඇති ආශ්චර්යමත් පුද්ගලයන්, යෝගීන්, අරුම පුදුම දෑ කියන්නේ කරන්නේ මේ ශක්ති බල මහිමයෙනි. මේ අයුරින් සිරුර තුළ ක්‍රියාත්මක වන විද්‍යුත් චුම්බක ක්ෂේත්‍රය ශරීර රශ්මිය (Human Aura) ලෙස හැඳින්වෙන අතර පියවි ඇසට නොපෙනෙන මෙය, මනස දියුණු කළ යෝගීන්ට දැකගත හැකි වේ. එදිනෙදා ජීවිතයේ දී යෝග අභ්‍යාස ශාරීරික ව්‍යායාමයක් ලෙස සිදු කිරීම පිළිබඳ ව යම් අවබෝධයක් සමාජය තුළ පැවතිය ද, ඉන් ඔබ්බෙහි වූ යෝග ආධ්‍යාත්මය පිළිබඳ ව හෝ චින්තන ශක්තිය, ශරීර රශ්මිය, දිව්‍යැස පිළිබඳ ව හෝ චිත්ත බලයෙන් රෝග සුව කිරීම පිළිබඳ අවබෝධයක් සමාජය තුළ නොපවතියි. ඒ අනුව යෝග අභ්‍යාසයන්හි අධ්‍යාත්මය හා ශරීර රශ්මිය පිළිබඳ ව යම් අවබෝධයක් සමාජගත කිරීම සඳහා සිදු කරන ලද මෙම පර්යේෂණයේ දී අන්තර්පාඨීත පාඨනය හා ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රාමාණික සම්පත් දායකයන්ගේ දැනුම ඔස්සේ අනාවරණිත කරුණු පහත පරිදි දැක්විය හැකි ය. ඒ අනුව සිරුර පුරා ක්‍රියාත්මක වන විද්‍යුත් ශක්තියක් ඇති අතර, ඒ ඒ පුද්ගලයා මනස දියුණු කළ ප්‍රමාණය අනුව ශරීරයෙන් නිකුත් වන රශ්මියේ වර්ණය වෙනස් වීම සිදු වේ. මෙම රශ්මිය නිරීක්ෂණය කොට පුද්ගලයෙකුගේ චරිත ස්වභාවය පැවසීමට හැකි වන අතර ම, මානසික ශක්තියෙන් රෝග සුව කිරීම සඳහා ද උපයෝගී කර ගනු ලබන්නේ ශරීරයෙන් නික්මෙන වර්ණ කිරණ බලය යි. මේ ආදි වශයෙන් යෝග අභ්‍යාස ඔස්සේ සිත දියුණු කිරීමෙහි ප්‍රතිලාභ ආදිය පිළිබඳ වත්, යෝග දර්ශනයේ දැක්වෙන චිත්ත ශක්තිය, ශරීර රශ්මිය, දිව්‍යැස, පරචිත්ත විජානය හා චිත්ත බලයෙන් රෝග සුව කිරීම පිළිබඳ ව සමාජය තුළ පවතින දැනුම් ඌනතාවට සැපයෙන පූරණයක් ලෙස මෙම පර්යේෂණය දිග හැරෙයි.

**මුඛ්‍ය පද** : යෝග දර්ශනය, චිත්ත ශක්තිය, විද්‍යුත් ශක්තිය, ශරීර රශ්මිය, මානසික රෝග